# ගෝඨාගේ පොතේ තියෙන අඳෝනාව මෙන්න

උමන්දා කුලසිංහ

තමා බලයට පත් වූ දා සිටම මෙරට තුළ අමුතු ආකාරයේ දේවල් සිදු වූ බව හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිය නවතම කෘතියේ සඳහන් කර තිබෙනවා.

ඔහු විසින් රචනා කරන ලද "ජනපති ධුරයෙන් මා නෙරපීමේ කුමන්ත්‍රණය" නම් කෘතිය එළි දැක්වුණා.

තමා බලයට පත්වීමට බලපෑ ප්‍රධාන හේතු තුනක් ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම ග්‍රන්ථයෙහි දක්වා තිබෙනවා.

සිංහලයන් හා සිංහල බෞද්ධයන් තම රට තුළම අවමානයට ලක් වී දෙවන පෙළට වැටී තිබීම, රටේ ණය ගැතිභාවය හා ආර්ථික පිරිහීම, ජාතික ආරක්ෂාව බිඳවැටීම එම කරුණු තුනයි.

කෙසේවෙතත්, ඔහු මෙම කෘතිය මඟින් පෙන්වා දී ඇත්තේ තමා බලයට පත්වීමට බලපෑ ප්‍රධාන එම හේතු තුන තම ඉල්ලා අස්වීම නිසා අදත් නොවිසඳී පවතින බවයි.

මෙම නොවිසිඳුණු ගැටලු අනාගතයේ වෙනත් නායකයකුට විසඳීමට සිදුවනු ඇති අතර ශ්‍රී ලංකාව මෙම නායකයා සොයාගනු ඇතිය යන්න සිය බලවත් ප්‍රාර්ථනය බවද පවසමින් ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම කෘතිය සමාප්ත කර තිබෙනවා.

මෙම කෘතියේ සඳහන් ඡේද අතරින් කිහිපයක් පහතින්,




"මා බලයට පත් වූ දා සිටම රට තුළ අමුතු දේවල් සිදු විය. මුලින්ම කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවය කරන කාන්තාවක් පැහැරගෙන ගොස් පහරදුන් බවට චෝදනාවක් මගේ ආණ්ඩුවට එල්ල විය. එය සම්පූර්ණ බොරුවක් බව ඉක්මනින්ම හෙළි විය. තානාපති කාර්යාලයක සුළු රැකියාවක් කරන පුද්ගලයකු කුමක් හෝ බලගතු පාර්ශ්වයක අනුග්‍රහය සහිතව මිස එවැනි බොරු රඟපෑමක් තනිව සැලසුම් කරාවි යැයි සිතන්නට අපහසුය. කෝවිඩ් - 19 වසංගතය අවසන් වනතුරු බලා සිටිය නොහැකි බවත්, අවුරුදු විසි ගණනක් මුළුල්ලේ පැවැති වැටුප් විෂමතා සඳහා වහාම සහන අවශ්‍ය බවත් පවසමින් ගුරුවරු වැඩ වර්ජනයක් ආරම්භ කළහ. ඉන් පසු රට පුරා ගෑස් පිපිරීම් ඇති විය. ඉන් පසු එරොෆ්ලොට් ගුවන් යානයක් ලංකාවේ දී රඳවා ගනු ලබන්නේ රුසියාව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ පුනර්ජීවනය සඳහා විශාල දායකත්වයක් ලබාදෙමින් සිටි අවස්ථාවකය. තනි සිද්ධීන් ලෙස හෝ සිද්ධිදාමයක් ලෙස ගත්ත ද, මේ කිසිවක් අහඹු සිදුවීම් විය නොහැක."

"එදා රටේ පැවැති ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ ආණ්ඩු වෙනසක් සඳහා වූ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරයකු අගමැති ධුරයට පත්කිරීමේ අවශ්‍යතාවයක් මතු විය. එම නිසා මම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාට කතාකර අගමැතිකම භාරගන්නා මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. පාර්ලිමේන්තු බහුතරයක් නොමැතිව රට පාලනය කළ නොහැකි බව පවසමින් ඔහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. ඉන් පසු මම සරත් ෆොන්සේකාට කතාකර අගමැතිකම භාර ගන්නා මෙන් ඔහුට ආරාධනා කර සිටියෙමි. ඔහු මට කීවේ, මම ඔහුව අගමැති හැටියට පත්කරන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර එතනින් එහාට කටයුතු ඉදිරියට ගෙන යමුය කියාය. ඔහුට පිරිනමනු ලැබූ තනතුර ඔහු එක්වර පිළිගත්තේ නැත."

"ඒ වනවිට තිබුණේ කැබිනට් මණ්ඩලයක් නොමැතිව රටට පාලන අධිකාරියක් නොමැති තත්ත්වයක්ය. ඒ අතරතුර, සමගි ජන බලවේගයේ මන්ත්‍රී කණ්ඩායමක් මා හමුවීමට පැමිණ ප්‍රේමදාස මහතා අගමැති ලෙස පත්කර පසුව ජනාධිපති ධුරයෙන් මා

☞ 25 වෙනි පිටුවට.....

